# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

## අන්ධ හා කායික අශක්නුතාවයක් ඇති අයදුම්කරුවන් සඳහා විශ්වවිද්‍යාල විශේෂ ප්‍රවේශය

## විශ්වවිද්‍යාල ප්‍රවේශය - 2024/2025 අධ්‍යයන වර්ෂය

2024 අ.පො.ස (උසස් පෙළ) විභාගයට පෙනී සිටි අන්ධ සිසුන් සහ කායික අශක්නුතාවයක් ඇති සිසුන්ගෙන් 2024/2025 අධ්‍යයන වර්ෂයේ පහත සඳහන් උපාධි පාඨමාලාවන් හැදෑරීම පිණිස එම අයදුම්කරුවන් සඳහා වූ විශ්වවිද්‍යාල විශේෂ ප්‍රවේශය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම ප්‍රවේශය යටතේ ප්‍රවේශය ඉල්ලුම් කරන අයදුම්කරුවන් 2024/2025 ප්‍රවේශ අත් පොතෙහි 1.2 සහ 2.2 යන ඡේදයන් හි දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතුය.( ප්‍රවේශ අත්පොත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වෙබ් අඩවියෙන් බා ගත කළ හැකිය)

### ඉහත විශේෂ ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා :-

- අන්ධ අපේක්ෂකයන් බ්‍රේල් ක්‍රමයෙන් 2024 අ.පො.ස (උසස් පෙළ) හදාරා තිබිය යුතුය.
- කායික අශක්නුතාවයක් ඇති අයදුම්කරුවන් පිළිගත හැකි වෛද්‍ය සහතික ඉදිරිපත් කළ යුතුය.
- 2024/2025 අධ්‍යයන වර්ෂයට අදාළව සාමාන්‍ය ප්‍රවේශය යටතේ අයදුම්පත් යොමු නොකළ අන්ධ සිසුන් සහ කායික අශක්නුතාවයක් ඇති සිසුන් ද මෙම විශේෂ ප්‍රවේශය යටතේ අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.
- පෙර මෙම විශේෂ ප්‍රවේශය යටතේ අයදුම්පත් යොමු කළ අපේක්ෂකයන් හටද පහත දැක්වෙන පාඨමාලා සඳහා නැවත අයදුම් කළ හැකිය.
- අයදුම්පතෙහි කැමැත්තේ අනුපිළිවල පැහැදිළි ව සටහන් විය යුතුය.
- ප්‍රායෝගික/ යෝග්‍යතා පරීක්ෂණ සහිත පාඨමාලා සඳහා ඉල්ලුම් කරන්නේ නම් අදාළ විශ්වවිද්‍යාල මගින් පවත්වන ප්‍රායෝගික/ යෝග්‍යතා පරීක්ෂණ සමත් විය යුතුය. මේ සඳහා අදාළ විශ්වවිද්‍යාල මඟින් ප්‍රායෝගික/යෝග්‍යතා පරීක්ෂණ පවත්වනු ඇත.

| යුනි කේතය | පාඨමාලාව | | බඳවා ගැනීමට නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | | | අන්ධ අපේක්ෂකයන් | කායික අශක්නුතාවයක් ඇති අපේක්ෂකයන් |
| 019C | කලා | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 07 | - |
| 016C | කළමනාකරණය | | - | 10 |
| 012C | පරිගණක විද්‍යාව | | - | 04 |
| 099C | මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව | | - | 03 |
| 096C | තොරතුරු පද්ධති | | - | 03 |
| 104C | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | | - | 02 |

| | | | | |
|---|---|---|---|---|
| 016J | කළමනාකරණය | ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | - | 05 |
| 079J | කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය | | - | 02 |
| 016M | කළමනාකරණය | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය | - | 05 |
| 068Z | සංගීතය # | සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 03 | 03 |
| 085Z | දෘශ්‍ය කලා # | | - | 03 |
| 007R | ව්‍යවහාරික විද්‍යාව(ජෛවීය විද්‍යාව ) | වවුනියා විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව | - | 05 |
| 015R | ව්‍යවහාරික විද්‍යාව(භෞතීය විද්‍යාව) | | - | |
| 038R | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICT) | | - | |
| 104R | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | | - | 10 |

# මෙම පාඨමාලා සඳහා සුදුසුකම් ලැබීම පිණිස අදාළ විශ්වවිද්‍යාල මගින් පවත්වන යෝග්‍යතා/ප්‍රායෝගික පරීක්ෂණ සමත් විය යුතුය.

**<u>අයදුම්පත් යොමු කළ යුතු ආකාරය</u>**

UGC වෙබ් අඩවිය හරහා මෙම අයදුම්පත බාගත කළ හැකිය.

නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **2025.12.01 වැනි දිනට හෝ එදිනට පෙර** යොමු කළ යුතුය.

විද්‍යුත් තැපෑල හරහා- daadmission@ugc.ac.lk. යන විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කළ යුතුය.

ලියාපදිංචි තැපෑල හරහා- මුද්‍රිත අයදුම්පත්‍රය ලියාපදිංචි තැපැල් මාර්ගයෙන් පහත දැක්වෙන ලිපිනයට එවිය යුතුය.

නියෝජ්‍ය ලේකම්/විශ්වවිද්‍යාල ප්‍රවේශ
අංක 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07

අයදුම්පත සමග කායික අශක්නුතාවයක් ඇති අපේක්ෂකයන් ඒ බව සනාථ කිරීම සඳහා අදාළ වෛද්‍ය සහතික / රෝග විනිශ්චය පත්‍රයේ සහතික කරන ලද ඡායා පිටපත් අමුණා එවිය යුතුය.

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් සහ නිසි ලෙස සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සභාපති
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
අංක 20, වෝඩ් පෙදෙස,
කොළඹ 7

2025 නොවැම්බර් 16